# මහායාන ත්‍රිකාය සංකල්පය සහ එහි දාර්ශනික පරිණාමය

කරගම්පිටියේ සිරිසුමන හිමි[1]

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු කාලීනව විවිධ භික්ෂු කණ්ඩායම් අතර ඇති වූ මතවාදී වෙනස්කම් හේතුවෙන් බුදුසමය විවිධ නිකායයන්ට බෙදී ගියේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රභවය වූ මහායාන බුදුසමයේ ප්‍රධානතම හා සුවිශේෂී මූලධර්මයක් ලෙස 'ත්‍රිකාය සංකල්පය' හැඳින්විය හැකිය. ථෙරවාදී බුදුසමය තුළ බුදුරජාණන් වහන්සේ පරම සත්‍යය අවබෝධ කරගත් සාමාන්‍ය මනුෂ්‍ය උත්තමයෙකු ලෙස දක්වා තිබුණ ද, මහායානිකයන් විසින් උන්වහන්සේව අතිමානුෂික තත්ත්වයට පත්කරමින් විශ්වයේ සදාකාලික පරමාර්ථය ලෙස ඉස්මතු කිරීමට උත්සාහ දරා ඇත. මෙම අරමුණ පෙරදැරි කරගෙන නිර්මාණය වූ ත්‍රිකාය සංකල්පය යටතේ බුදුරජාණන් වහන්සේගේ ශරීරය නිර්මාණකාය, සම්භෝගකාය, සහ ධර්මකාය යනුවෙන් අංශ තුනකින් විස්තර කෙරේ. ථෙරවාද සහ මහායාන සම්ප්‍රදායන් අතර පවතින ප්‍රධානතම වෙනස්කමක් වන්නේ බුද්ධ සංකල්පය හඳුන්වා දී ඇති ආකාරයයි. ථෙරවාදයේ එන ඓතිහාසික මානුෂික බුදුරජාණන් වහන්සේ වෙනුවට, මහායානය තුළින් බුදුරජාණන් වහන්සේ අතිමානුෂික, සදාකාලික හා දේවත්වයට සමාන තත්ත්වයකට ආරෝපණය කළේ කෙසේද සහ ඒ සඳහා බලපෑ හේතු මොනවාද යන්න මෙහි මූලික ගැටලුවයි.

විශේෂයෙන්ම, බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ විනය පිටකයේ සඳහන් ඇතැම් සිදුවීම්, දෙවන සංගීතියෙන් පසු බිහි වූ මහාසාංඝික ලෝකෝත්තරවාදීන්ගේ අදහස් සහ එකල පැවැති හින්දු දර්ශනයේ හා මූර්ති/දේව සංකල්පයන්ගේ බලපෑම මහායාන ත්‍රිකාය සංකල්පය බිහිවීමට හේතු වූ ආකාරය නිරවුල්ව තේරුම් ගැනීම පර්යේෂණාත්මක ගැටලුව ලෙස මතු වේ. එමෙන්ම, අෂ්ට සාහස්‍රිකා ප්‍රඥාපාරමිතා සූත්‍රයෙන් ආරම්භ වී, විඥානවාදී හා යෝගාචාරී ආචාර්යවරුන් (අසංග, නාගාර්ජුන ආදී) ඔස්සේ මෙම ත්‍රිකාය සංකල්පය කාලීනව විකාශනය වූ ආකාරය පිළිබඳ ක්‍රමවත් විමර්ශනයක අවශ්‍යතාව මෙහිදී පැන නැගී ඇත. මහායාන දර්ශනයේ සහ මූලික සිද්ධාන්තයන්ගේ හදවත බඳු වන ත්‍රිකාය සංකල්පය පිළිබඳ හදාරන විද්‍යාර්ථීන්ට මෙම පර්යේෂණය ඉතා වැදගත් වේ. එහි වැදගත්කම කරුණු කිහිපයකින් පෙන්වා දිය හැකිය.

- බුද්ධ සංකල්පයේ පරිණාමය වටහා ගැනීම
- බාහිර ආගමික හා දාර්ශනික බලපෑම් හඳුනා ගැනීම
- පුරාවිද්‍යාත්මක හා සූත්‍ර සාහිත්‍යමය සාධක තහවුරු කරගැනීම
- ථෙරවාද හා මහායාන බුද්ධ සංකල්පයන් අතර පවතින දාර්ශනික වෙනස්කම්,

1 ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. ksirisumanathero@gmail.com

ත්‍රිකාය සංකල්පයේ ඓතිහාසික හා දාර්ශනික විකාශනය සහ එහි පැතිරීම පිළිබඳ විද්‍යාත්මක හා සාහිත්‍යමය පදනමක් ගොඩනගා ගැනීමට මෙම පර්යේෂණය වැදගත් වේ.

**පර්යේෂණයේ අරමුණු**

ථෙරවාදී බුදුසමයේ එන ඓතිහාසික-මානුෂික බුද්ධ සංකල්පයට සාපේක්ෂව, මහායාන බුදුසමය තුළ බුදුරජාණන් වහන්සේ අතිමානුෂික හා පරම සත්‍යයක් ලෙස ඉස්මතු කිරීමට භාවිත කළ 'ත්‍රිකාය සංකල්පයෙහි' ආරම්භය, දාර්ශනික පදනම සහ කාලීන විකාශනය පිළිබඳව පුළුල් ලෙස විමර්ශනය කිරීම

- ත්‍රිකාය සංකල්පයේ ප්‍රභවයට බලපෑ ඓතිහාසික හා දාර්ශනික මූල බීජ හඳුනා ගැනීම
- ත්‍රිවිධ කායයන්ගේ ස්වභාවය හා ඒවායින් ඉටුවන කාර්යභාරය විශ්ලේෂණය කිරීම
- මහායාන සූත්‍ර හා ආචාර්යවාදී සාහිත්‍යය තුළ සිදුවූ කාලීන විකාශනය පරීක්ෂා කිරීම
- පුරාවිද්‍යාත්මක හා සෙල්ලිපි සාධක මගින් ත්‍රිකාය සංකල්පයේ ව්‍යාප්තිය තහවුරු කරගැනීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක සහ පද්‍ය/ග්‍රන්ථ මූලික පර්යේෂණ ගණයට අයත් වේ. බුද්ධ සංකල්පයේ දාර්ශනික හා ඓතිහාසික විකාශනය අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වන බැවින් සංඛ්‍යාත්මක දත්ත වෙනුවට මූලාශ්‍රයාගත තොරතුරු විශ්ලේෂණය කිරීම සිදු කෙරේ. එහිදී පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ප්‍රධාන වශයෙන් මූලාශ්‍රය වර්ග දෙකකින් ලබා ගනී. ප්‍රාථමික මූලාශ්‍රය සහා ද්විතීයික මූලාශ්‍රය යනුවෙනි.

**ප්‍රතිඵල**

ත්‍රිකාය සංකල්පය යනු එකවර බිහි වූවක් නොව, එය විවිධ දාර්ශනික නිකායන් ඔස්සේ කාලයත් සමඟ ක්‍රමයෙන් පරිණාමය හා සංවර්ධනය වූ සිද්ධාන්තයක් බව පර්යේෂණයෙන් පැහැදිලි වේ.

ථෙරවාද බුදුසමයේ එන ඓතිහාසික, මානුෂීය බුද්ධ ස්වරූපය මහායානය තුළදී සම්පූර්ණයෙන්ම අතිමානුෂික ලක්ෂණවලින් හෙබි නිර්මාණයක් බවට පත් වී ඇති බව පෙන්වා දෙයි.

මහායාන ත්‍රිකාය සිද්ධාන්තය බිහිවීම සඳහා ථෙරවාද සම්ප්‍රදායේ එන ඇතැම් ධර්ම කරුණු මූලබීජ වී ඇති බව පර්යේෂණයෙන් හෙළි වේ.

**සාකච්ඡාව හා නිගමනය**

බුදුරදුන්ගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂු ශාසනය තුළ ඇති වූ විවිධ මතවාදී ගැටුම් සහ දේශපාලනික මෙන් ම සාමාජීය සාධක හේතුවෙන් බුදුදහම ප්‍රධාන සම්ප්‍රදායයන් දෙකකට බෙදී ගියේ ය. එයින් ථෙරවාද සම්ප්‍රදාය බුදුරදුන්ගේ ඓතිහාසික මානුෂීය ස්වරූපය සහ මූලික ධර්ම කරුණු ඒ අයුරින් ම ආරක්ෂා කිරීමට උත්සාහ කළ අතර, මහායාන සම්ප්‍රදාය යුගානුකූලව නව දාර්ශනික මානයන් ඔස්සේ බුදුදහම විකාශනය කිරීමට කටයුතු කළේ ය. මහායාන බුදුසමයේ දක්නට ලැබෙන සුවිශේෂීම සහ ප්‍රධානතම දාර්ශනික සිද්ධාන්තය වන්නේ "ත්‍රිකාය සංකල්පය'' යි. බුදුරදුන් යනු හුදු ඓතිහාසික පුද්ගලයෙකු පමණක් නොව, ඔහු සමස්ත විශ්වයේ ම පරම සත්‍යය නිරූපණය කරන අතිමානුෂික සහ සදාකාලික තත්ත්වයක් බව පෙන්වා දීම මෙම සංකල්පයේ මූලික අරමුණ විය. මහායාන බුදුසමයේ ඓතිහාසික විකාශනය වඩාත් ස්ථාවර මට්ටමකට පත්වන්නේ ක්‍රි.ව. 1 වන සියවසේදී ය. ඉන්දියාවේ කණිෂ්ක රජුගේ රාජ්‍ය අනුග්‍රහය ඇතිව, කාශ්මීරයේ ජාලන්දරහිදී පාර්ශ්ව සහ අශ්වඝොෂ යන මහා තෙරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සිවුවන ධර්ම සංගායනාව මහායානයේ නිල ආරම්භය සහ ව්‍යාප්තිය උදෙසා සෘජුව ම බලපෑවේ ය.

කෙසේ වෙතත්, මහායානික මූලධර්මවල බීජ බුදුරදුන් ජීවමාන අවධියේදී ම ශාසනය තුළ පැවති බව විනය පිටකයේ එන කරුණුවලින් සනාථ වේ. චුල්ලවග්ග පාලිය සහ පාරාජිකපාළිය වැනි ග්‍රන්ථවල සඳහන් වන දේවදත්ත තෙරුන්ගේ ශාසන භේදකාරී ක්‍රියාකලාපය, ඝෝෂිතාරාමයේ ධර්මධර-විනයධර භික්ෂූන්ගේ ගැටුම් මෙන්ම සුනක්ඛත්ත සහ කෝඛාලික වැනි භික්ෂූන්ගේ විනය විරෝධී චර්යාවන් පසුකාලීනව මහායානය වැනි විකල්ප සම්ප්‍රදායයන් බිහිවීමට අවශ්‍ය පසුබිම සකස් කළේ ය. ථෙරවාදයේ දෙවන සංගීතියෙන් පසු වජ්ජිපුත්තකාදී භික්ෂූන්ගේ මූලිකත්වයෙන් දස අකැප වස්තුව පදනම් කරගෙන මහාසාංඝික නිකාය බිහි විය. මෙම මහාසාංඝික සම්ප්‍රදාය පසුව ඒකවෝහාරික, විඤ්ඤත්තිවාදී, චෛතියවාදී, මහීශාසක සහ ලෝකෝත්තරවාද වශයෙන් කොටස් පහකට බෙදී ගිය අතර එයින් ලෝකෝත්තරවාදීන් ඉදිරිපත් කළ බුද්ධ සංකල්පය ත්‍රිකාය සිද්ධාන්තයේ ළමා අවධිය ලෙස සැලකිය හැකිය.

ලෝකෝත්තරවාදීන්ගේ මූලික ඉගැන්වීම වූයේ බුදුරජාණන් වහන්සේ කායික හා මානසික වශයෙන් ලෝකය ඉක්මවා ගිය (ලෝකෝත්තර) සදාකාලික උත්තමයෙකු බවයි. සිද්ධාර්ථ ගෞතමයන් යනු එම සදාකාලික බුදුන් වහන්සේ ලෝකයාගේ යහපත උදෙසා කාලයෙන් කාලයට මවාපාන එක් නිර්මාණාත්මක අවස්ථාවක් පමණක් බව ඔවුහු විශ්වාස කළහ. මෙම අදහස පසුකාලීනව මහායාන මධ්‍යමක සහ යෝගාචාර දර්ශන ඔස්සේ තවදුරටත් වර්ධනය වී නිර්මාණකාය, සම්භෝගකාය සහ ධර්මකාය යන ත්‍රිකාය සංකල්පය බවට පත් විය. මෙම සංකල්පය ගොඩනැගීමේදී එවකට ඉන්දියාවේ පැවති හින්දු දේව දර්ශනයේ සහ අවතාරවාදයේ බලපෑම ද අතිශයින් ම ඉවහල් විය. ආචාර්ය සර්වපිල්ලි රාධක්‍රිෂ්ණන් මහතා සිය (Indian Philosophy) ග්‍රන්ථයේ දක්වන පරිදි, භගවත් විෂ්ණු භක්තිකයන් තම දෙවියන් විවිධ අවතාර මඟින් ලොවට පහළ වන බව විශ්වාස කළා සේම, මහායානිකයන් ද බුදුන් වහන්සේ සත්වයාගේ මුදවා ගැනීම උදෙසා විවිධ කායයන්ගෙන් පෙනී සිටින බව විශ්වාස කළහ. ථෙරවාද මූලාශ්‍රයවල පවා බුදුරදුන් උපක ආජීවකයාට සහ ද්‍රෝණ බමුණාට තමන් වහන්සේ හඳුන්වා දීමේ දී

"තමන්ට සමාන කෙනෙකු මෙලොව නැති බවත්, තමන් සියල්ල ජයගත් සර්වඥයෙකු" බවත් ප්‍රකාශ කළ අවස්ථා, බුදුන් වහන්සේ අතිමානුෂික තත්ත්වයක ලා සැලකීමට මහායානිකයන්ට මූලබීජ සපයා ඇත.

*''න මේ ආචරියො අත්ථි . සදිසො මෙ න විජ්ජති*

*සදේවකස්මිං ලෝකස්මිං .- නත්ථි මෙ පටිපුග්ගලා ''.* (විනය පිටකයේ මහාවග්ග පාළියේ මහාක්ඛන්ධකය)

*සබ්බාභිභූ සබ්බවිදූ හමස්මි .සබ්බෙසු ධම්මේසු අනූපලිත්තො*

*අහංහි අරහා ලොකෙ .අහං සත්ථා අනුත්තරො*

*ඒකෝම්හි සම්මා සම්බුද්ධෝ සීතිභූතෝස්මි නිබ්බුතෝ.* (අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයට අයත් දෝණ සූත්‍රය)

**ත්‍රිකාය පිළිබඳ ව්‍යුහගත විග්‍රහය**

**නිර්මාණකාය**

නිර්මාණකාය යනු ලෝක සත්වයා සන්සාරයෙන් මුදවා ගනු පිණිස බුදුන් වහන්සේ විසින් මවනු ලබන භෞතික රූපයයි. මහායානිකයන්ට අනුව බුදුන් වහන්සේ කිසිදා මනුෂ්‍ය ලෝකයට පැමිණෙන්නේ නැත. *"භගවා තුසිත භවනෙ නිබ්බත්තො තත්ථෙව වසති.. මනුස්ස ලෝකං න ආගච්ඡති.. නිම්මිත රූපං මත්තකං පනෙත්ථ දස්සති..,* (අභිධර්ම පිටකය "කථාවත්ථු ප්‍රකරණය'' කථාවත්ථු පාලිය) උන්වහන්සේ සැමදා තුසිත භවනේ වැඩ වෙසෙමින් "උපාය කෞෂල්‍යය" භාවිත කරමින් මිනිස් ලොව තුළ නිර්මාණ ශරීරයක් පමණක් දර්ශනය කරති.

**ලක්ෂණ සහ ක්‍රියාකාරීත්වය**

මිනිසුන් අතර පෙනී සිටිමින් ශිල්ප හැදෑරීම, උපත ලැබීම, අභිසම්බෝධිය ලැබීම සහ පරිනිර්වාණයට පත්වීම ආදී සියල්ල මනුෂ්‍යයන්ට ධර්ම මාර්ගය පෙන්වීම සඳහා කළ රංගනයන් පමණකි. බුදුරදුන් ස්වාභාවික රෝගාබාධ, බඩගින්න හෝ වේදනාවන්ට ලක් නොවේ. ථෙරවාදයේ බුදුන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් පැන් ඉල්ලූ අවස්ථා ("පිපාසිතෝස්මි ආනන්ද පිබිස්සාමි") හෝ කොන්දේ කැක්කුමක් පිළිබඳ පැවසූ අවස්ථා ("පිට්ඨී ආගිලායති තමහං ආයමිස්සාමි") සඳහන් වුව ද, මහායානයට අනුව ඒවා හුදු නිර්මාණාත්මක පෙනී සිටීම් පමණි.

මහායාන ප්‍රඥා පාරමිතා සූත්‍රයෙහි මෙය "රූපකාය'' ලෙස ද හඳුන්වයි. මහායාන සූත්‍රාලංකාරයට අනුව, මෙම නිර්මාණකායෙහි කෙළවරක් නැති අතර එකවර ශරීර දහස් ගණනක් මවාපාමින් විශ්වයේ විවිධ දිශාවන්හි දහම් දෙසීමට බුදුරදුන්ට හැකියාව ඇත. විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගම, කාශ්‍යප සහ ගෞතම යන සත් බුදුවරුන් මහායානය හඳුන්වන්නේ "සප්ත මානුෂී බුද්ධ'' යනුවෙනි.

**සම්භෝගකාය**

සම්භෝගකාය යනු සාමාන්‍ය මිනිස් ඇසට නොපෙනෙන, අතිශය සියුම් වූත්, ආලෝකවත් වූත් දිව්‍යමය ස්වභාවයකි. මෙය බුදුවරුන්ට සහ දස භූමි පදප්‍රාප්ත මහා බෝධිසත්ත්වවරුන්ට පමණක් දැකගත හැකි, ඔවුන්ගේ අධ්‍යාත්මික වින්දනය සහ සන්නිවේදනය උදෙසා පවතින කායකි.

**ව්‍යුහය සහ ස්වරූපය**

සම්භෝගකාය ප්‍රධාන කොටස් දෙකකට බෙදෙයි. ස්ව සම්භෝගකාය (බුදුවරුන් තමන් වෙනුවෙන්ම විඳින අධ්‍යාත්මික සැපය) සහ පර සම්භෝගකාය (උසස් බෝධිසත්ත්වවරුන් උදෙසා මවන කාය යනුවෙනි. මෙම කාය ද්වාතිංසත් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සහ අසීත්‍යානු ව්‍යංජනයන්ගෙන් අලංකෘතය. පඤ්චවිංසති සාහස්‍රිකා සූත්‍රයට අනුව, සම්භෝගකායෙහි එක ම රෝම කූපයකින් නිකුත් වන ආලෝකය සමස්ත චක්‍රවාලය ම ඒකාලෝක කිරීමට සමත් වේ. බුදුන් වහන්සේ ගිජ්ඣකූට පර්වතයේදී සහ සුඛාවතී ව්‍යූහයේදී උත්කෘෂ්ට මහායාන සූත්‍ර දේශනා කළේ මෙම සම්භෝගකායෙනි.

**ධර්මකාය**

නිර්මාණකාය සහ සම්භෝගකාය යන දෙක ම සාපේක්ෂ වූ සම්මුති සත්‍යයට අයත් වන අතර, ධර්මකාය යනු නිරපේක්ෂ වූ පරමාර්ථ සත්‍යයයි. මෙය බුදුරදුන්ගේ සැබෑ, සදාකාලික, නිත්‍ය වූ ශරීරය වන අතර සියලු බුදුවරුන්ට පොදු වූවකි. සද්ධර්ම පුණ්ඩරික සූත්‍රයේ දැක්වෙන පරිදි "ධර්මකායම තථාගතයන් වහන්සේ වේ''.

**ස්වභාවය සහ දාර්ශනික අර්ථය**

ධර්මකාය වචනයෙන් විස්තර කළ නොහැකි ය. (අනිර්වචනීය ය) එය නිෂ්ප්‍රපඤ්ච වූත්, අගක් මුලක් නැති වූත්, අවකාශය මෙන් සර්වකාලීනව පවත්නා වූත් තත්ත්වයකි. ප්‍රඥා පාරමිතා හෘදය සූත්‍රයට අනුව බුදුන් වහන්සේව රූපකායෙන් හෝ මහා පුරුෂ ලක්ෂණවලින් දැකිය නොහැකිය; උන්වහන්සේව දැකිය හැක්කේ ධර්මකාය තුළින් පමණි. අසංග ආචාර්යවරයා මහායාන සූත්‍රාලංකාරයේදී පෙන්වා දෙන්නේ ධර්මකාය යනු ස්වභාවික කාය බවයි. ධර්මකාය හැඳින්වීම සඳහා තථතා, ධර්මධාතු, තථාගතගර්භ, භූතතථතා සහ නිර්වාණය යන පර්යාය පද ද භාවිත වේ. යෝගාචාර සම්ප්‍රදායට අනුව මෙහි අවස්ථා දෙකකි. ස්වභාවකාය (නිත්‍ය ධාතුව) සහ ඥානකාය (අනිත්‍ය ස්වභාවය). නාගාර්ජුන පාදයන් පවසන්නේ ධර්මකාය යනු ලෝකයේ මූල පරමාර්ථය වන අතර එය සමස්ත ජගත්ත (ලෝකය) සමඟ සමාන වන බවයි."තථාගතො යත් ස්වභාවථ තත් ස්වභාවං ඉධං ජගත.''

**නිගමනය**

මහායාන 'ත්‍රිකාය සංකල්පය' යනු හදිසියේ පහළ වූවක් නොව, බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ පැවැති ඇතැම් සිදුවීම් සහ දෙවන ධර්ම සංගීතියෙන් පසු බිහි වූ මහාසාංඝික ලෝකෝත්තරවාදීන්ගේ අදහස් මුල් කරගනිමින් කාලානුරූපීව විකාශනය වූවකි. ථෙරවාද බුදුසමය තුළ බුදුරජාණන් වහන්සේ යනු පරම සත්‍යය

අවබෝධ කරගත්, නමුදු සාමාන්‍ය මනුෂ්‍ය ලක්ෂණවලට (ලෙඩවීම්, වේදනා, ආහාර ගැනීම් ආදියට) මුහුණ දුන් ශාස්තෘවරයෙකු ලෙස දක්වා තිබුණද, මහායානිකයන් විසින් උන්වහන්සේ අතිමානුෂික, සදාකාලික සහ විශ්වීය පරමාර්ථය ලෙස ස්ථාපිත කිරීමට මෙම ත්‍රිකාය සංකල්පය යොදාගෙන ඇත.

කාය සංකල්පය නිර්මාණය වීමේදී එකල ඉන්දියාවේ පැවැති හින්දු දර්ශනය හා එහි එන දේව/මූර්ති සංකල්ප (විශේෂයෙන් බ්‍රහ්ම, ඊශ්වර, විෂ්ණු අවතාර සංකල්ප) මහායානය කෙරෙහි සෘජුවම බලපා ඇති බව පැහැදිලි වේ. මෙම ත්‍රිකාය සංකල්පය පසු කාලීනව ශ්‍රී ලංකාව වැනි ථෙරවාදී රටවලට පවා ව්‍යාප්ත වී ඇති බව මිහින්තලේ අම්බස්ථල සෙල්ලිපිය වැනි පුරාවිද්‍යාත්මක සාධකවලින් ද තහවුරු වේ. කෙසේ වෙතත්, මහායාන සම්ප්‍රදාය තුළ රහත් සංකල්පය පහත් කොට බෝධිසත්ව සංකල්පය ඉස්මතු කිරීමටත්, බුදුරජාණන් වහන්සේ ලෝකයේ සදාකාලික පරම සත්‍යය ලෙස අතිමානුෂික ලෙස නිරූපණය කිරීමටත් යොදාගත් ප්‍රධානතම දාර්ශනික මෙවලම 'ත්‍රිකාය සංකල්පය' බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - ත්‍රිකාය සංකල්පය, ධර්මකාය, නිර්මාණකාය, මහායාන, සම්භෝගකාය

**ආශ්‍රිත ග්‍රන්ථ**

අරියවිමල හිමි, කේ. (2018). *බුද්ධ ධර්මය.* කොළඹ: සමයවර්ධන පොත්හල.

අස්සජි හිමි, ජී. *ශාසන ප්‍රභා.* මුල්ලේරියාව: මදුරප්‍රිය මුද්‍රණාලය.

ඥානසීහ හිමි, එච්. (1964). *විඥප්ති මාත්‍රා සිද්ධිවාදය.* කොළඹ: ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

නානායක්කාර, එස්. (2003). *මුල් බුදු දහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්.* දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්ධදත්ත හිමි, පී. (2018). *ථෙරවාදී බෞද්ධ දර්ශනය.* දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ම.නි, අරියපරියේසන සූත්‍රය, (2006). බු.ජ.මු., දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මේධානන්ද හිමි, ඩී. (1992). *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්.* වරකපොල: ආර්ය මුද්‍රණ.

යසස්සි හිමි, පී. (2019). *බෞද්ධ නිකාය විකාශය.* පිළියන්දල: ශ්‍රී සද්ධර්මාරාමය.

රාහුල හිමි, ඒ. මහානාම හිමි, බී. *මහායානය.* දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.